# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1790/5 - 2012 දෙසැම්බර් මස 24 වැනි සඳුදා - 2012.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව තුල වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2012.12.17 වන දින පවත්වන ලද බිංගිරිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිමුත් තුෂාර ඒකනායක,
සභාපති,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2012 දෙසැම්බර් මස 17 දින,
බිංගිරිය ප්‍රාදේශීය සභාවේ දී ය.

වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පළකරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේදී ස්ථිර කරන ලද බවට 2011.04.28 දිනැති අංක 1703/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ iv (අ) වන කොටසෙන් ප්‍රකාශයට පත් කර ඇති, ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2011.05.24 වැනි දින පැවති මහා සභාව විසින් පිළිගෙන අංක 1715 හා 2011.07.15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසෙන් නිවේදනය කර ඇති අතර එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනවල සඳහන් ගාස්තු 2013 වර්ෂයට පනවා අයකළ යුතුයැයි යෝජනා කරමි.

උපලේඛනය

| *I වන තීරුව* | *II වන තීරුව එක්වරක් පමණක් ගෙවන වාර්ෂික ලියාපදිංචි ගාස්තුව රු. ශත* | *III වන තීරුව නවතා තැබීමේ ගාස්තුව මාසයකට රු. ශත* |
|---|---|---|
| 01. සෑම ත්‍රීරෝද රථයක් සඳහාම | 100.00 | 100.00 |
| 02. ත්‍රීරෝද රථ නොවන වෙනත් වාහන සඳහා | 50.00 | 50.00 |

01 - 323